# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2215/39 - 2021 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**1949 අංක 58 දරන මුදල් නීති පනත**

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10 (c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති.

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

**අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම**

1. මේ රීති "2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන අනුව, අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදළ රීති මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, නැවත දනුම් දෙන තුරු ඃ

(i) අපනයනය කරන ලද සියලු භාණ්ඩවලට අදළව අපනයනය කිරීමෙන් ලද මුදල්, භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය, සහ

(ii) සෑම අපනයනයක් සඳහාම ලද සියලු මුදල් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබුණු වහාම, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

5. ඉහත සඳහන් කරන ලද අපනයනය කිරීම මගින් ලද මුදල් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකින් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය, මුදල් මණ්ඩලය මගින් කලින් කලට යම් වෙනත් ප්‍රතිශතයක් නියම කරනු ලබන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

6. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන කිරීම මගින් ලද මුදල් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 වන රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළවන හෝ ඒ හා බැඳෙන සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට ඉහත 6 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

8. මෙකී රීති, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සඳහා සහ භාණ්ඩ නැව් ගත කරන ලද දිනයේ සිට එකසිය අසූව (180) වන දිනය මෙම රීති බලාත්මක වීමෙන් පසුව ඕනෑම දිනයක එළැඹෙන්නේ වී නම්, අදාළ විය යුතුය.

9. මෙම රීති, මෙහි මතු සඳහන් වන දිනයේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වේ.

10. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයනය මගින් ලද මුදල්" යන්නට, 2019.10.17 දිනැති අංක 2145/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන මුදල් ඇතුළත් වේ.

11. මෙම රීතීන් හි කාර්යය සඳහා, "බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන යටතේ ඒවාට දී ඇති අර්ථයන් අදහස් වේ.

03 - 137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.